# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය, දෙවන වසර - 2017

## පවුල් නීතිය
(පැ තුනයි )

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : **07**

ප්‍රශ්න හතරකට **(04)** පමණක් පිළිතුරු සපයන්න.
(නොපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)

---

1) විවාහය සහ පවුල් සබඳතා තුළ කාන්තාවන්ට හා ගැහැණු දරුවන්ට සමානව සැලකීම් තහවුරු කිරීම සඳහා, කාන්තාවන්ට එරෙහි සියලුම අකාරයේ වෙනස්කම් පිටුදැකීමේ සම්මුතියේ (CEDAW) 16 වන වගන්තියෙන් දක්වා තිබෙන අන්තර්ජාතික බැඳීම් සමඟ ශ්‍රී ලංකා පවුල් නීතිය කොතෙක් දුරට අනුගතව තිබේද?
සාකච්ඡා කරන්න. අදාළ සම්මුතීන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සහ ව්‍යවස්ථා ප්‍රතිපාදන මෙන්ම නඩු තීන්දු නීතිය ඇසුරින් ඔබේ පිළිතුර තහවුරු කිරීම අපේක්ෂිතය.

2) 2010 වසරේ අප්‍රේල් මස සුසීලා සහ රවී විවාහ විය. විවාහයෙන් සති දෙකකට පසු රවී ව්‍යාපෘති කාර්යක් සඳහා මාස හයකට නවසීලන්තයට ගියේය. සුසීලා ඇගේ කාර්යාලයේ වැඩ කටයුතු හේතුවෙන් ඔහු සමඟ නවසීලන්තයට යාම ප්‍රතික්ෂේප කළාය. 2010 දෙසැම්බර් මස සුසීලා තම දියණිය වන ගීතාව ප්‍රසූත කළාය. සුසීලා තම කාර්යාල මිතුරකු වන නාදන් සමඟ සමීප ඇසුරක් පවත්වන බව, ලංකාවට පැමිණි රවී තම දෙමාපියන් මාර්ගයෙන් දැන ගත්තේය. මෙම සම්බන්ධතාවය හේතුවෙන් සුසීලා

සමඟ ආරවුල් ඇතිකරගන්නා රවී වහාම එය නතර කරන ලෙස ඇයට පැවසුවේය. සුසීලා එම ඉල්ලීම නොසලකා හරිමින් නාදන් සමඟ එම ඇසුර දිගටම පවත්වාගෙන ගියාය. දැන් දරුවාගේ පීතෘත්වය බැහැර කරන රවී සුසීලාට සහ දරුවාට නඩත්තු ගෙවීමද ප්‍රතික්ෂේප කරයි.

සුසීලාගේ නීතිඥවරයා ලෙස ඔබේ නඩුව අධිකරණයට ඉදිරිපත් කරන ආකාරය සහ විරුද්ධ පාර්ශවයේ නීතිඥවරයාගේ තර්කයන්ට ප්‍රතිචාර දක්වන ආකාරය පිළිබඳව සාකච්ඡා කිරීම ඔබගෙන් අපේක්ෂා කෙරේ. ඔබගේ සාකච්ඡාව තුළ අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩුතීන්දු නීතිය මෙන්ම විද්‍යාත්මක සාක්ෂි යොදාගැනීමට ඇති හැකියාවද අන්තර්ගත විය යුතුය.

3) i) සාමාන්‍ය නීතියට වඩා විවාහ ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන්, විවාහය සම්බන්ධ මුස්ලිම් නීතිය තුළ, සාධනීය ප්‍රවේශයකක් අන්තර්ගත වේ. සාකච්ඡා කරන්න.

ii) ධනවත් ව්‍යාපාරිකයකු වන අකුම්හට, තම පහළොස් හැවිරිදි දියණිය වන ෆාතිමාව විවාහ කර දීමට ඇගේ පියා කටයුතු සූදානම් කරයි. අකුම්ව විවාහ කරගැනීමට බලාපොරොත්තු නොවන ෆාතිමාට අවශ්‍ය වන්නේ ඉගෙනීමෙහි නිරතව වෛද්‍යවරියක වීමටය.

ෆාතිමා සහ අකුම් අතර සිදු කිරීමට අපේක්ෂිත විවාහයේ වලංගුභාවය පිළිබඳව මුස්ලිම් නීතිය යටතේ සාකච්ඡා කිරීම ඔබෙන් අපේක්ෂා කෙරේ. ඔබේ තර්කයන් අන්තර්ජාතික සහ දේශීය නීති ප්‍රතිපාදන සහ අදාළ නඩුතීන්දු නීතිය ඇසුරින් සනාථ කරන්න.

4) "දරුවාගේ භාරකාරත්වය සහ රැකවරණය ලබා දීම සම්බන්ධයෙන් තීරණය කිරීමේදී යොදාගත යුතු නිර්ණායකයන් පිළිබඳව එකඟතාවයකට ශ්‍රී ලංකා නීතිය තවමත් ලඟා වී නොමැත".

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නෙහිද? ශ්‍රී ලංකාව විසින් භාර ගෙන ඇති අන්තර්ජාතික බැඳීම් ඇසුරින් ඔබගේ විශ්ලේෂණය සනාථ කළ යුතුය. අවම වශයෙන් වෙනත් එක් අධිකරණ පද්ධතියක්වත් ඇසුරුකර ගැනීම අපේක්ෂිතය.

5) 1994 වසරේදී විවාහ වූ කමලා සහ සරත් දරුවන් තිදෙනෙකුගේ දෙමාපියන්ය. දහනව හැවිරිදි සාරා විශ්වවිද්‍යාල ශිෂ්‍යාවක වන අතර දාහත් හැවිරිදි නිමල් කොළඹ පාසලක ඉගෙනුම ලබයි. පස් හැවිරිදි සඳුනි විශේෂ අවශ්‍යතා සහිත දරුවකු වන අතර කමලාට ඇයව එවන් දරුවන් සඳහා වන පාසලකට යැවීමට අවශ්‍ය වේ.

ව්‍යාපාරිකයකු වන සරත් නුවර පදිංචි වී ඔහුගේ වතුයායන් පාලනය කරයි. තම පවුලේ සාමාජිකයන් බැලීමට ඔහු මාස කිහිපයකින් පැමිණ නොමැති අතර හිතාමතාම ඔවුන් ගේ වියදම් පිළිබඳව සොයා බැලීමද ඔහු නොසලකා තිබේ.

තමන්ව සහ තම දරුවන්ව නඩත්තු කිරීම අපහසු බව කමලා වටහා ගනියි. ඇය සරත්ගෙන් නඩත්තු සම්බන්ධයෙන් විමසා සිටින විට ඔහු ප්‍රකාශ කළේ ඔහුගේ ව්‍යාපාරය බංකොළොත් වී ඇති බැවින් නඩත්තු ගෙවීම සඳහා ප්‍රමාණවත් ආදායමක් ඔහු සතු නොවන බවයි. සාරාව නඩත්තු කිරීම තමන්ගේ වගකීමක් නොවන බව කියා සිටින සරත් සිතන්නේ රටේ උසස් අධ්‍යාපන ආයතනයන්හි සෑම විටම වැඩ වර්ජන පවතින බැවින් උසස් පෙළ විභාගය සඳහා නිමල් පෙනී සිටීම ප්‍රයෝජනවත් නොවන බවයි. ඔහු තවදුරටත් සිතනුයේ සඳුනිගේ අධ්‍යාපනය වෙනුවෙන් වියදම් කිරීම අනවශ්‍ය මුදල් නාස්ති කිරීමක් වන බවයි. කමලා යමෙකු සමඟ අනාචාරී සබඳතාවක් පවත්වනවා යැයි ප්‍රකාශ කරමින් ඇයව නඩත්තු කිරීමද ඔහු ප්‍රතික්ෂේප කරයි.

1999 අංක 37 දරන නඩත්තු පනත ඇසුරින් කමලාට උපදෙස් දෙන්න. ඔබේ පිළිතුර නඩු තීන්දු නීතිය ඇසුරින් සනාථ කරන්න.

6) “අප විසින් විවාහය කඩාකප්පල් වීම පිළිබඳ සිද්ධාන්තය නිර්දේශ කිරීමට තුඩු දුන් එක් හේතුවක් වන්නේ මතුපිට කාරණා සම්බන්ධයෙන් අවධානය යොමු කරනවා වෙනුවට වෛවාහක සම්බන්ධතාවයේ යථාර්ථය ග්‍රහණය කරගැනීමට, එය අධිකරණයට උපකාරී වන බැවිනි”.

*Putting Asunder*- A Divorce Law for Contemporary Society, Report of the Committee appointed by the Archbishop of Canterbury (1964), p 58.

දික්කසාදය සඳහා වන වෛවාහක වරද පිළිබඳ ක්‍රමය අතහැරීම සඳහා ඉහත ප්‍රකාශය තර්කානුකූල පදනමක් සපයනු ලැබේද? ශ්‍රී ලංකාව, දික්කසාදය සම්බන්ධයෙන් වන සාමාන්‍ය නීතිය කෙසේ සංශෝධනය කළ යුතුද යන්න අවම වශයෙන් උඩරට නීතිය සහ වෙනත් එක් අධිකරණ බලප්‍රදේශයක දක්නට ලැබෙන යහපත් ප්‍රවේශයන් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

7) සූර්යා සහ සහනි කොළඹ විශ්වවිද්‍යාලයේදී හමුවූ අතර ඔවුන් සිය පවුල්වල කැමැත්තට විරුද්ධව විවාහ වූහ. මාතර සිටින ඇගේ පවුල සමඟ වන සියලුම සබඳතා අතහරින සහනි සූර්යා සමඟ කොළඹ ජීවත් වූවාය. වසර කිහිපයකට පසු සූර්යාට තම රැකියාව අහිමි වූ අතර ඔහුගේ දෙමාපියන් සූර්යාව සහ සහනිව පවුල වෙත නැවත භාර ගන්නා ලදි. යාපනය, රෝහල් පාරේ සිටින සූර්යාගේ දෙමාපියන් සමඟ ජීවත් වීමට සහනි සහ සූර්යා ගියෝය. සූර්යාගේ දෙමාපියන් දෙදෙනාම යාපනයේ උපන් අය වන අතර සූර්යාද විශ්වවිද්‍යාලයට ඇතුළත් වනතුරු යාපනයේ ජීවත් වූයේය. පසුව ඔවුන්ට නීලා නම් දියණියක්ද ශාම් නම් පුතකුද ලැබුනි. දරුවන් කෙරෙහි ලැදි වන සූර්යාගේ දෙමාපියන්, ඔවුන් සතු යාපනයේ නිවස සහ ත්‍රිකුණාමලයේ ඉඩම සූර්යාට ත්‍යාගකළ අතර ඔහු එහි තමාගේ රෙදිවියන කර්මාන්ත ශාලාව ආරම්භ කළේය.

යාපනේ රෝහලේ හෙදියක ලෙස සේවය කරමින් සිටි සහනි කර්මාන්ත ශාලාව පිහිටුවීම සඳහා සූර්යාට සහය වීමට සේවයෙන් ඉවත් වූවාය. කර්මාන්තශාලාව ගොඩනැගීම සඳහා සූර්යා දැඩි මූල්‍ය අවශ්‍යතාවකින් සිටින විට සහනි ඇගේ ඉතුරුම්

හා විවාහයට පෙර ඇගේ දෙමාපියන් විසින් ඇයට ත්‍යාග කළ රත්රන් ආභරණ උකස් කිරීමෙන් ලද මුදල් සූර්යාට ලබා දුන්නාය. කර්මාන්තශාලාව ඉක්මනින් දියුණු වූ අතර විශාල ලෙස ලාභ ලැබීම ඇරඹිණි. සූර්යා තම ව්‍යාපාර සඳහා නිරතුරුව කොළඹ යන බැවින්, මරණය හෝ ආබාධිත තත්වයට පත්වීම් ආවරණය වන ලෙස වූ ජීවිත රක්ෂණයක් ලබා ගත්තේය. මේ අතරතුර තම ව්‍යාපාරයේ උපදේශිකාවක වන මායා සමඟ සූර්යා සබඳතාවක් ඇරඹූ අතර ඔවුනට ශිවා නම් පුතකු සිටී.

කොළඹට ගමන් කරමින් සිටින අතරතුරදී සූර්යා අනතුරකට මුහුණපා මිය ගියේය. විසිහතරහැවිරිදි නීලා විවාහකය. ශාම් පහළොස් හැවිරිදි වේ. දෙහැවිරිදි ශිවා මායා සමඟ ජීවත් වේ. සූර්යා සතු දේපළ සම්බන්ධයෙන් සහනිට සහ දරුවන්ට පවතින උරුම අයිතිවාසිකම් සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න.